248099

AL/2018/12/S

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.18 / 0830 - 1100

සාමාන්‍ය පොදු පරීක්ෂණය
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

12 S

පැය දෙකයි මිනිත්තු තිහයි
இரண்டு மணித்தியாலமும் முப்பது நிமிடமும்
Two hours and thirty minutes

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
* **1** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** 2018 පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල පවත්වනු ලැබුවේ කොහිදී ද?
(1) ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නගරය
(2) ඕස්ට්‍රේලියාවේ ගෝල්ඩ් කෝස්ට් නගරය
(3) ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරය
(4) ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නගරය
(5) එංගලන්තයේ බර්මිංහැම් නගරය

**2.** 2018 පෙබරවාරි 4 වන දින ශ්‍රී ලංකාවේ නිදහස් දිනය නිමිති කරගෙන 70 වන සංවත්සරය සැමරීමේ ප්‍රධාන ආරාධිතයා ලෙස බ්‍රිතාන්‍ය රජින නියෝජනය කරමින් සහභාගි වූ රාජකීය පවුලේ සාමාජිකයා කවුද?
(1) ඇන්ඩෲ කුමරු
(2) චාල්ස් කුමරු
(3) හැරී කුමරු
(4) විලියම් කුමරු
(5) එඩ්වඩ් කුමරු

**3.** මෙම අප්‍රිකානු රටෙහි වසර 37 ක් ජනාධිපති ලෙස කටයුතු කරනු ලැබූ රොබට් මුගාබේ 2017 නොවැම්බර් මාසයේදී ඔහුගේ තනතුරෙන් ඉල්ලා අස්විය.
(1) සිම්බාබ්වේ
(2) දකුණු අප්‍රිකාව
(3) මොසැම්බික්
(4) කෙන්යාව
(5) නයිජීරියාව

**4.** "කාලය පිළිබඳ කෙටි ඉතිහාසයක්" (A Brief History of Time) යන ජනප්‍රිය විද්‍යා පොත ලියූ මෙම ප්‍රසිද්ධ ඉංග්‍රීසි ජාතික විද්‍යාඥයා 2018 මාර්තු 14 දින අභාවප්‍රාප්ත විය.
(1) ජෝන් යංග්
(2) ආතර් සී. ක්ලාක්
(3) කාල් සේගන්
(4) ට්‍රෙවර් බේලිස්
(5) ස්ටීවන් හෝකින්ග්

**5.** ජානමය, කායික, චර්යාමය සහ පාරිසරික සාධකවල සංයෝජනයක් හේතුවෙන් වැළඳෙන බෝ නොවන රෝග අවම කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වැඩසටහන් දියත් කර ඇත. බෝ නොවන රෝගයක් **නොවන්නේ** පහත සඳහන් කවරක් ද?
(1) පිළිකා
(2) හෘදවාහිනී රෝග
(3) සරම්ප
(4) නිදන්ගත වකුගඩු රෝගය
(5) දියවැඩියාව

**6.** ජාතික ග්ලූකෝමා සතිය 2018 මාර්තු 11 දින සිට 17 දින තෙක් විය. ග්ලූකෝමා යනු මිනිස් සිරුරේ මෙම ඉන්ද්‍රියයට බලපාන රෝගයකි.
(1) ඇස
(2) කණ
(3) දිව
(4) සන්ධි
(5) අක්මාව

**7.** ක්ෂුද්‍ර ජීවීන් නිසා විනාශයට පත්නොවන අපද්‍රව්‍ය ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ පා ඇති ප්‍රධාන ගැටලුවකි. පහත දැක්වෙන ඒවායින් කවරක් ක්ෂුද්‍ර ජීවීන් නිසා විනාශයට පත් වන අපද්‍රව්‍යයක් වේ ද?
(1) ලෝහ
(2) සංශ්ලේෂී තන්තු
(3) පොලිතීන්
(4) ආහාර අපද්‍රව්‍ය
(5) වීදුරු

**8.** යුරේසියානු රටවල් අතර සම්බන්ධතාව සහ සහයෝගිතාව කෙරෙහි අවධානය යොමු කරන 'එක තීරයක්-එක මාවතක්' (OBOR) වැඩසටහනට ශ්‍රී ලංකාව සහාය ප්‍රකාශ කර තිබේ. OBOR යෝජනා කරන රට කුමක් ද?
(1) චීනය
(2) ඉන්දියාව
(3) රුසියාව
(4) ඕස්ට්‍රේලියාව
(5) ඇමරිකා එක්සත් ජනපදය

**9.** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් 2017 මෝටර් රථ පනතේ අංක 18 වන සංශෝධනය අනුව මෑතකදී නව වාහන පන්ති දෙකක් ලියාපදිංචි කිරීම හඳුන්වා දී තිබේ. එවැනි එක් වාහන පන්තියක් වනුයේ කුමක් ද?
(1) රෝද දෙකේ ට්‍රැක්ටර
(2) ත්‍රිරෝද රථ
(3) සැහැල්ලු ලොරි රථ
(4) බර ලොරි රථ
(5) ක්වාඩ්‍රිසයිකල

[දෙවැනි පිටුව බලන්න.

**10.** 2017 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ පනත යටතේ අවශ්‍ය වන, පළාත් පාලන ආයතනවල අනිවාර්ය කාන්තා නියෝජන ප්‍රතිශතය කීය ද?

(1) 5 (2) 10 (3) 20 (4) 25 (5) 50

**11.** මෙම නගරයේ පිහිටුවා ඇති අභ්‍යන්තර ගුවන් තොටුපළෙහි ගුවන් ගමන් මෙහෙයුම් සහ සේවා 2018 මාර්තු මස ආරම්භ විය.

(1) පොළොන්නරුව (2) ත්‍රිකුණාමලය (3) මඩකලපුව
(4) සීගිරිය (5) හබරණ

**12.** පන්දුව පළුදු කිරීමේ අපචාරය නිසා ඕස්ට්‍රේලියානු ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් මෙම වසරේදී වසරක කාලයක් සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා තරග තහනමක් පනවන ලද ඕස්ට්‍රේලියානු ක්‍රිකට් කණ්ඩායමේ නායකයා නම් කරන්න.

(1) ස්ටීව් ස්මිත් (2) ඩේවිඩ් වෝනර් (3) කැමරන් බෙන්ක්‍රොෆ්ට්
(4) ෂේන් වෝන් (5) ස්ටීව් වෝ

**13.** පැරිස් දේශගුණ ගිවිසුම යනු දේශගුණ විපර්යාස හා සම්බන්ධ වන හරිතාගාර වායු විමෝචනය, අවම කිරීම, අනුගත කිරීම හා මූල්‍යකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය තුළ ඇති, වසර 2020 දී සාධන මට්ටමකට එළැඹීමට නියමිත එකඟතාවකි. 2017 ජූනි මාසයේදී මෙම ගිවිසුමෙන් ඉවත් වූයේ කවර රට ද?

(1) එක්සත් රාජධානිය (2) ඇමරිකා එක්සත් ජනපදය (3) ප්‍රංශය
(4) රුසියාව (5) චීනය

**14.** ශ්‍රී ලංකා රජය 2017 නොවැම්බර් මාසයේදී එක්තරා රටක රජය සමග රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System - EPS) පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය. EPS යනු රැකියාවලට ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් බඳවා ගැනීම සඳහා එරට රජය ක්‍රියාත්මක කරන විනිවිද පෙනෙන ක්‍රමයකි. එම රට නම් කරන්න.

(1) ඉන්දියාව (2) උතුරු කොරියාව (3) දකුණු කොරියාව
(4) චීනය (5) ඕමානය

**15.** මෙම ලාංඡනය නියෝජනය කරන්නේ කුමන සංවිධානය ද?



(1) ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC)
(2) ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය (OECD)
(3) සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM)
(4) එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO)
(5) ලෝක වෙළෙඳ සංවිධානය (WTO)

**16.** භාග සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කළ විට 12.5% කුමක් ද?

(1) $\frac{1}{8}$ (2) $\frac{1}{5}$ (3) $\frac{1}{4}$ (4) $\frac{5}{12}$ (5) $\frac{1}{2}$

**17.** $x$ සහ $y$ ඕනෑම නිඛිල දෙකක් සඳහා $\oplus$ කර්මය $x \oplus y = x + y - 1$ මගින් අර්ථ දක්වා ඇත. $-1 \oplus (1 \oplus 2)$ හි අගය කුමක් ද?

(1) −2 (2) −1 (3) 0 (4) 1 (5) 2

**18.** එක්තරා සතියක සඳුදා සිට සිකුරාදා තෙක් දින පහේදී කෞතුකාගාරයක් නැරඹීමට 900 දෙනෙක් පැමිණියහ. ඔවුන්ගෙන් $\frac{1}{3}$ ක් සඳුදා ද $\frac{5}{12}$ ක් අඟහරුවාදා ද පැමිණියහ. අනෙක් දින තුන තුළ පැමිණි සංඛ්‍යාව කීය ද?

(1) 150 (2) 200 (3) 225 (4) 350 (5) 400

**19.** භාණ්ඩ අලෙවි කරන්නකුට මසකට විකුණුම් 200 ක සාමාන්‍යයක් වූ ඉලක්කයක් වසරකදී සපුරා ගැනීමට ඇත. තෙවැනි කාර්තුව අවසානයේදී ඔහු විකුණුම් 1740 ක් අත්පත් කරගෙන තිබේ. ඉලක්කය කරා ළඟාවීමට අවසාන කාර්තුව තුළ ඔහු කොපමණ ප්‍රමාණයක් විකිණිය යුතු ද?

(1) 550 (2) 600 (3) 660 (4) 760 (5) 1060

**20.** යන්ත්‍රයක් නියත ශීඝ්‍රතාවකින් පැයකට භාණ්ඩ 240 ක් නිෂ්පාදනය කරයි. එවැනි යන්ත්‍ර දෙකක් මිනිත්තු 35 කදී භාණ්ඩ කීයක් නිෂ්පාදනය කරයි ද?

(1) 105 (2) 140 (3) 210 (4) 280 (5) 315

**21.** $U, V, X, Y$ හා $Z$ යනු නගර 5කි. $U$ සිට 4 km ක් නැගෙනහිර දෙසට $V$ ද, $V$ සිට 3 km ක් උතුරු දෙසට $X$ ද, $X$ සිට 12 km ක් නැගෙනහිර දෙසට $Y$ ද, $Y$ සිට 9 km උතුරු දෙසට $Z$ ද පිහිටා ඇත. $U$ සහ $Z$ අතර ඇති රේඛීය දුර කොපමණ ද?

(1) 10 km (2) 20 km (3) 28 km (4) 30 km (5) 40 km

**22.** ගැහැනු ළමයින් 30ක් සහ පිරිමි ළමයින් 20ක් සිටින පන්තියක පැවැත්වූ පරීක්ෂණයකදී ගැහැනු ළමයින්ගේ ලකුණුවල සාමාන්‍යය 80 ද පිරිමි ළමයින්ගේ ලකුණුවල සාමාන්‍යය 70 ද විය. මෙම පන්තියේ ළමයින්ගේ ලකුණුවල සාමාන්‍යය කීය ද?

(1) 76 (2) 75 (3) 74 (4) 73 (5) 72

[තුන්වැනි පිටුව බලන්න.

**23.** පාසලක අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් 75% ක් විෂය 9 ම සමත් වූහ. ඉතිරි සිසුන්ගෙන් 60% ක් විෂය 7 ක් හෝ 8 ක් සමත් වූහ. පාසලෙන් විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් කවර ප්‍රතිශතයක් විෂය 7කට වඩා අඩුවෙන් සමත් වූවෝ ද?

(1) 0 (2) 10 (3) 15 (4) 30 (5) 45

**24.** පවුලක $A, B, C$ සහ $D$ යන එක් එක් දරුවාට පිළිවෙළින් 5:2:4:3 අනුපාතයට මාසික දීමනාවක් ලැබෙයි. $C$ ට ලැබෙන මුදල $B$ ට ලැබෙන මුදලට වඩා රුපියල් 2000 ක් වැඩි නම් $D$ ගේ මාසික දීමනාව කීයද?

(1) රු. 1500 (2) රු. 2000 (3) රු. 2500 (4) රු. 3000 (5) රු. 3500

**25.** කිසියම් භාණ්ඩයක නිෂ්පාදන වියදම පළමුවන භාණ්ඩ 1000 සඳහා එක් භාණ්ඩයකට රු. 150 බැගිනි. ඉන් අනතුරුව එක් එක් භාණ්ඩය සඳහා වියදම රු. 50 කි. භාණ්ඩ 5000 ක් නිෂ්පාදනය කිරීම සඳහා යන වියදම රුපියල් කීයද?

(1) 300 000 (2) 350 000 (3) 450 000 (4) 600 000 (5) 750 000

**26.** 30 $\text{km h}^{-1}$ වේගයෙන් ගමන් කරන දුම්රියක් 500 m ක් දිග උමගකට ඇතුළු වේ. දුම්රියේ දිග 250 m කි. උමග තුළින් මුළු දුම්රියම ගමන් කිරීමට කොපමණ කාලයක් ගතවේ ද?

(1) මිනිත්තු 1 (2) මිනිත්තු 1.5 (3) මිනිත්තු 2 (4) මිනිත්තු 2.5 (5) මිනිත්තු 3

**27.** එක්තරා ග්‍රන්ථයක ලැයිස්තුගත මිල රුපියල් 900 කි. එම ග්‍රන්ථයෙන් පිටපත් 1000 ක් පහත පරිදි විකුණන ලදී.


* 50% ක වට්ටමක් සහිතව 60% ක්
* 30% ක වට්ටමක් සහිතව 20% ක්
* ලැයිස්තුගත මිලට ඉතිරි ප්‍රමාණය






මුළු ආදායම රුපියල් කීයද?

(1) 500 000 (2) 510 000 (3) 550 000 (4) 576 000 (5) 710 000


**28.** $A$ හා $B$ දුම්රිය දෙක $X$ දුම්රිය ස්ථානයේ සිට එකම වේලාවට ගමන් අරඹා එකම දිශාවට සමාන්තර දුම්රිය මාර්ගවල ගමන් කරනුයේ $X$ සිට 75 km ක් දුරින් පිහිටි $Y$ දුම්රිය ස්ථානයට එකම වේලාවේදී ළඟාවීමට ය. $A$ දුම්රිය $B$ ට වඩා 50% ක් වේගවත් ය. $B$ දුම්රිය නොනවත්වා ගමන් කරන අතර $A$ දුම්රිය $X$ හා $Y$ අතර වූ දුම්රිය ස්ථානවල නැවැත්වීම සඳහා මිනිත්තු 25 ක මුළු කාලයක් ගනී. $B$ දුම්රියේ වේගය කුමක් ද?

(1) 50 $\text{km h}^{-1}$ (2) 55 $\text{km h}^{-1}$ (3) 60 $\text{km h}^{-1}$ (4) 65 $\text{km h}^{-1}$ (5) 70 $\text{km h}^{-1}$






**29.**  පහත රූපවලින් කවරක් මෙම රූපයේ භ්‍රමණයක් වේ ද?

(1)  (2)  (3)  (4)  (5) 

**30.** පහත දී ඇත්තේ ඝනකයක් සඳහා වූ පතරමකි.



පහත රූපවලින් කවරක්, ඉහත පතරම භාවිතයෙන් සාදාගත් ඝනකයක් නිරූපණය **නොකරයි** ද?

(1)  (2)  (3)  (4)  (5) 


[හතරවැනි පිටුව බලන්න.


**31.** කමල් ස්වයං රැකියාවක් වශයෙන් ලියුම් කවර සෑදීම ආරම්භ කළේ, දිනකට කවර මිටිය බැගින් සාදන්නෙමැයි ඉටා ගත්තේය. පළමුවැනි දිනයේදී ඔහුට කවර මිටිය සෑදීම සඳහා පැය හතරක් අවශ්‍ය විය. පුහුණුවීම නිසා ඔහුගේ කවර සෑදීමේ වේගය දිනපතා දෙගුණ විය. තුන්වැනි දිනයේ සිට සෑම දිනකම ඔහු කවර මිටි 2 බැගින් සෑදීය. ඔහු හතරවැනි දිනයේදී කොපමණ වේලාවක් කවර සෑදීමට යෙදවී ද?

(1) මිනිත්තු 30 (2) පැය 1 (3) පැය 2 (4) පැය 4 (5) පැය 8

● අංක **32** සහ **33** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදන ආයතනයක පසුගිය වර්ෂ පහ තුළ වාර්ෂික ලාභය සහ නිෂ්පාදන පිරිවැය පහත ප්‍රස්තාරවලින් දැක්වේ.




**32.** භාණ්ඩ අලෙවිය මගින් ආයතනය වැඩිම ආදායමක් උපයනු ලැබුවේ පසුගිය වර්ෂ පහ අතුරෙන් කවර වර්ෂයේදී ද?

(1) 2013 (2) 2014 (3) 2015 (4) 2016 (5) 2017

**33.** පසුගිය වර්ෂ පහ තුළ ආයතනය විසින් උපයනු ලැබූ මුළු ආදායම කොපමණ ද?

(1) රු. මිලියන 5 (2) රු. මිලියන 10 (3) රු. මිලියන 15
(4) රු. මිලියන 20 (5) රු. මිලියන 25

● අංක **34** සහ **35** ප්‍රශ්න සඳහා පහත දැක්වෙන තොරතුරුවලට යොමු වන්න.

A, B, C, D, E, F නමැති පබලු හයක් වෘත්තාකාරව පිළියෙල කර ඇත්තේ E හා F යාබද වන නමුත් A හා B යාබද නොවන සේත් C හා D යාබද නොවන සේත් ය.

**34.** B පබලුව C හා F දෙකටම යාබද වේ නම් A හා F යා කෙරෙන සරල රේඛාවේ එකම පැත්තේ පිහිටන්නේ කවර පබලු දෙක ද?

(1) B හා C (2) B හා D (3) B හා E (4) C හා D (5) C හා E

**35.** A පබලුව D හා E දෙකටම යාබද වේ නම් F ට යාබද වන්නේ කවර පබලු යුගලය ද?

(1) B හා C (2) B හා D (3) B හා E (4) C හා E (5) D හා E

● අංක **36** සිට **38** තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

A, B, C, D හා E එක්තරා සමාගමක සේවා මුර ක්‍රමයට සේවය කරන ආරක්ෂක නිලධාරීන් පස්දෙනෙකි. එක් සේවා මුරයකදී සේවයෙහි නිරත වන්නේ එක් අයකු පමණි. ඔවුහු සඳුදා සිට සිකුරාදා තෙක් සේවයෙහි නිරත වෙති. සෑම දිනකම උදය, සවස සහ රාත්‍රි වශයෙන් සේවා මුර තුනක් ඇත. ඒ අනුව සතියේ දින පහ සේවා මුර 15 කට බෙදා ඇති අතර එක් එක් නිලධාරියා එම දින පහ තුළ සේවා මුර තුනක සේවයේ යෙදිය යුතුය. තව ද කිසිදු නිලධාරියෙක් එක ළඟ සේවා මුර දෙකක සේවයේ නොයෙදෙයි. එක්තරා සතියක පහත දැක්වෙන තොරතුරු වාර්තා වෙයි.

* A සේවය කර ඇත්තේ බදාදා සහ බ්‍රහස්පතින්දා පමණි.
* B එක ළඟ දින තුනක රාත්‍රි සේවා මුරවල පමණක් සේවයේ යෙදී තිබේ.
* C එක ළඟ දින තුනක සවස සේවා මුරවල පමණක් සේවයේ යෙදී තිබේ.
* B අවස්ථා දෙකකදී ම D ගේ සේවා මුරයට පසුව ඊළඟට එන සේවා මුරයෙහි සේවයේ යෙදී තිබේ.

**36.** බ්‍රහස්පතින්දා සවස සේවා මුරයෙහි යෙදුනේ කවුරුන් ද?

(1) A (2) B (3) C (4) D (5) E

**37.** සඳුදා උදයෙහි සේවා මුරයෙහි යෙදුනේ කවුරුන් ද?

(1) A (2) B (3) C (4) D (5) E

**38.** D සහ E සේවයේ නිරත වූ මුළු රාත්‍රි සේවා මුර ගණන කීය ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

[පස්වැනි පිටුව බලන්න.

- අංක **39** සහ **40** ප්‍රශ්න, පහත දැක්වෙන ත්‍රිපුද්ගල සංවාදය මත පදනම් වේ.

පළමුවන පුද්ගලයා : පෙරේරා මහත්මිය විදේශගතව ඉඳලා තිබෙනවා.
දෙවන පුද්ගලයා : ඇත්තෙන්ම, ඇය රටවල් තුනකට හෝ බාගදා ඊටත් වැඩි ගණනකට ගිහින් තිබෙනවා.
තුන්වන පුද්ගලයා : නැහැ, ඇය කිසිදා රටවල් දෙකකට ගිහින් නැහැ.

**39.** පෙරේරා මහත්මිය පෙර නොගිය රටකට යන්නී නම්, ඉහත සංවාදයෙහි සත්‍ය ප්‍රකාශ කරන පුද්ගලයින්ගේ සංඛ්‍යාව අඩු වෙයි. එය එසේ වී නම්, ඇය මේ වන විට රටවල් කීයකට ගොස් තිබේ ද?
(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**40.** විදේශගතව සිට මෑතකදී ආපසු පැමිණි පෙරේරා මහත්මිය ඉහත සංවාදයෙහි එක් පුද්ගලයකු පමණක් සත්‍ය ප්‍රකාශ කරන බව නිරීක්ෂණය කරයි. ඇය රටවල් කීයකට ගොස් තිබේ ද?
(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**41.** දී ඇති නිරීක්ෂණ සහ නිගමන යුගල අතුරෙන් නිරීක්ෂණය හා නිගමනය එකිනෙක මාරු කළ විට වලංගු **නොවිය** හැකි යුගලය කුමක් ද?

| **නිරීක්ෂණය** | **නිගමනය** |
|---|---|
| (1) X යනු බදාදාවකි. | X + 1 බ්‍රහස්පතින්දාවකි. |
| (2) X ඉරට්ටේ වේ. | X + 1 ඔත්තේ වේ. |
| (3) X කිලෝග්‍රෑම්වලින් මනිනු ලැබේ. | X + 1 කිලෝග්‍රෑම්වලින් මනිනු ලැබේ. |
| (4) X අධික අවුරුද්දකි. | X + 1 සාමාන්‍ය අවුරුද්දකි. |
| (5) X = 2X | X = 0 |

- අංක **42** සහ **43** ප්‍රශ්නවල ප්‍රකාශයක් හා නිරීක්ෂණ පහක් බැගින් දී ඇත. ඒවායින් කවර නිරීක්ෂණය, එය සත්‍ය වේ නම්, දී ඇති ප්‍රකාශයේ විශ්වසනීයතාව වඩාත් ඇඩිව **දුර්වල** කරයි ද?

**42. ප්‍රකාශය** : වර්ෂාව මුහුදුබඩ ප්‍රදේශවල ආර්ද්‍රතාව වැඩි කරයි.
(1) වියළි කාලයේදී, මහනුවරට වඩා වැඩියෙන් ගාල්ල ආර්ද්‍ර විය.
(2) වියළි කාලයේදී, ගාල්ලට වඩා වැඩියෙන් මහනුවර ආර්ද්‍ර විය.
(3) ගාල්ල සිට මහනුවරට ගමන් කරද්දී ආර්ද්‍රතාව අඩු වෙයි.
(4) ගාල්ල, වියළි කාලයට වඩා අඩුවෙන් වැසි කාලයේදී ආර්ද්‍ර විය.
(5) මහනුවර, වියළි කාලයට වඩා වැඩියෙන් වැසි කාලයේදී ආර්ද්‍ර විය.

**43. ප්‍රකාශය** : මෙම වර්ෂයේදී 'නාරංබික්' සමාගම එහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කාන්තා නියෝජනය වැඩි කර තිබේ.
(1) 'නාරංබික්' මේ වසරේදී පසුගිය වසරට වඩා අඩුවෙන් කාන්තා ශ්‍රමිකයින් සේවයේ යොදවා තිබේ.
(2) 'නාරංබික්හි' මේ වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පසුගිය වසරට වඩා පිරිමි සාමාජිකයෝ වැඩියෙන් සිටිති.
(3) 'නාරංබික්'හි මේ වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පසුගිය වසරට වඩා කාන්තා සාමාජිකාවෝ අඩුවෙන් සිටිති.
(4) පසුගිය වසර දෙක තුළදී 'නාරංබික්' කිසිදු කාන්තා ශ්‍රමිකයකු අධ්‍යක්ෂ තනතුරට උසස් කර නොමැත.
(5) වසර හතරක් 'නාරංබික්'හි සිටි එකම අධ්‍යක්ෂිකාව ඉතා මෑතකදී ඉල්ලා අස්වූවාය.

**44.** සංකල්පමය වශයෙන් වෙනස්වන අනුක්‍රමය තෝරන්න.
(1) 2015 ⟶ 2016 ⟶ 2017 ⟶ 2018
(2) උදේ ආහාරය ⟶ දිවා ආහාරය ⟶ තේ ⟶ රාත්‍රි ආහාරය
(3) උතුර ⟶ නැගෙනහිර ⟶ දකුණ ⟶ බටහිර
(4) මධ්‍යහ්න 12.00 ⟶ පස්වරු 6.00 ⟶ මධ්‍යම රාත්‍රි 12.00 ⟶ පෙරවරු 6.00
(5) වයඹ ⟶ නිරිත ⟶ ගිනිකොන ⟶ ඊශාන

**45.** හමුදා ඛණ්ඩයක් ඔවුනට ලැබුණු XBSEIUJX යන රහස් පණිවිඩය WITHDRAW යනුවෙන් විකේතනය කළහ. ඒ අනුව CONCEALED යනුවෙන් විකේතනය කරනු ලබන්නේ පහත දැක්වෙන කවර පණිවිඩය ද?
(1) PDBMFDQOD (2) EFMBFDOPD (3) MDEBDFPOF
(4) PBDMBQQOQ (5) PRDMRPOQP

● අංක **46** සහ **47** ප්‍රශ්න D, M, N, T සහ V යන ළමයින් පස්දෙනකු පිළිබඳ පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

* V ට වඩා M බරින් අඩු ය.
* N ට වඩා T බරින් වැඩි ය.
* M ට වඩා D බරින් වැඩි ය.
* N සහ V බරින් සමාන ය.

**46.** ඉහත තොරතුරුවලින් පහත දැක්වෙන කවරක් අපෝහනය කළ හැකි ද?


(1) D ට වඩා T බරින් වැඩි ය.
(2) D ට වඩා V බරින් අඩු ය.
(3) V ට වඩා T බරින් අඩු ය.
(4) N ට වඩා D බරින් අඩු ය.
(5) M ට වඩා T බරින් වැඩි ය.

**47.** ඉහත දත්ත පමණක් යොදා ගනිමින් පහත දැක්වෙන කවර ප්‍රකාශය නිගමනය කළ හැකි ද?

(1) බර අනුව දෙවැනි ස්ථානය ගන්නා පුද්ගලයා නිර්ණය කළ හැකි ය.
(2) බරින් අඩුම පුද්ගලයාත් බරින් වැඩිම පුද්ගලයාත් නිර්ණය කළ හැකි ය.
(3) බරින් අඩුම පුද්ගලයා හෝ බරින් වැඩිම පුද්ගලයා හෝ නිර්ණය කළ නොහැකි ය.
(4) බරින් අඩුම පුද්ගලයා නිර්ණය කළ හැකි නමුත් බරින් වැඩිම පුද්ගලයා නිර්ණය කළ නොහැකි ය.
(5) බරින් වැඩිම පුද්ගලයා නිර්ණය කළ හැකි නමුත් බරින් අඩුම පුද්ගලයා නිර්ණය කළ නොහැකි ය.

**48.** අ.පො.ස. උසස් පෙළ 2017 විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා විෂය ධාරා අනුව සුදුසුකම් ලැබූ පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රතිශත පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.
විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් **නොලැබූ** අයදුම්කරුවන්ගේ **අඩුම** ප්‍රතිශතය ඇත්තේ කවර විෂය ධාරාවේ ද?

(1) ජෛවීය විද්‍යා
(2) භෞතීය විද්‍යා
(3) වාණිජ්‍ය
(4) කලා
(5) ජෛව පද්ධති තාක්ෂණවේදය




● අංක **49, 50** සහ **51** ප්‍රශ්නවල නිගමනයක් සහ I, II හා III යනුවෙන් අංකනය කරන ලද ප්‍රකාශ තුනකින් යුත් තොරතුරු කට්ටලයක් බැගින් දී ඇත.

* එක් ප්‍රකාශයක් පමණක් භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් *A* තෝරන්න.
* I හා II ප්‍රකාශ දෙක එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් *B* තෝරන්න.
* I හා III ප්‍රකාශ දෙක එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් *C* තෝරන්න.
* II හා III ප්‍රකාශ දෙක එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් *D* තෝරන්න.
* I, II හා III ප්‍රකාශ තුනම එක්ව භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම් *E* තෝරන්න.

**49.** නිගමනය : වරාය ප්‍රදේශයේ වර්ග කිලෝමීටර 2.69 ක මුහුද ආවරණය කරමින් මිනිසා විසින් සකසන ලද පස් වැටියක් මත වරාය නගරය ඉදිකෙරෙමින් පවතී.

I. පසුගිය රජය හා වර්තමාන රජය විසින් වරාය නගර ව්‍යාපෘතිය අනුමත කර ඇත.
II. චීනය හා ශ්‍රී ලංකාව මෙම ව්‍යාපෘතිය සම්බන්ධව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.
III. සමහර පරිසරවේදීහු හා දේශපාලනඥයෝ මෙම ව්‍යාපෘතිය පිළිබඳව සැලකිලිමත් වෙති.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**50.** නිගමනය : සංගීතය මානසික ආතතිය අඩු කරයි.

I. සංගීතයට සවන්දීම ඇතුළු විනෝදාංශවල යෙදෙන ලෙස වෛද්‍යවරු අවවාද කරති.
II. ඇවිදීම සහ ආහාර පාලනය හෘද රෝගීන්ගේ සෞඛ්‍යය වර්ධනය කරයි.
III. මානසික ආතතිය හේතුවෙන් ඇති වන අධික වෙහෙස සංගීත ප්‍රතිකාර මගින් සුව කළ හැකිය.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*


**51.** නිගමනය : ඩෙංගු යනු භයානක රෝගයකි.

I. ඩෙංගු වෛරසය හේතුවෙන් ඩෙංගු රෝගය හටගනියි.
II. ඩෙංගු රෝගීන්ගේ ශරීර උෂ්ණත්වය අඛණ්ඩව ඉතා ඉහළ අගයක පවතී.
III. ප්‍රතිකාර නොලබන ඩෙංගු රෝගීහු මරණයට පත්වෙති.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

[හත්වැනි පිටුව බලන්න.

**52.** වෘත්තිකයින්, වෛද්‍යවරුන් හා ඉංජිනේරුවන් අතර සම්බන්ධය නිරූපණය වන්නේ කවර රූපසටහන මගින් ද?



(1) (2) (3) (4) (5)

- අංක **53** හා **54** ප්‍රශ්න, පහත දැක්වෙන ඡේදය මත පදනම් වේ.

ශ්‍රී ලංකාවේ මහ රෝහල්වල දියවැඩියා මධ්‍යස්ථාන ස්ථාපනය කෙරෙමින් පවතී. එම සෑම මධ්‍යස්ථානයකදී ම විශේෂඥයින් විසින් දියවැඩියා රෝගීන් පරීක්ෂාවට ලක් කෙරෙන අතර ඔවුන්ගේ කායික මිනුම්, ලිපිඩ පැතිකඩ සම්බන්ධ රුධිර හා මූත්‍රා විශ්ලේෂණ, රුධිර සීනි මට්ටම් හා මූත්‍රා මයික්‍රො-ඇල්බියුමින් මට්ටම් පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලැබේ. එම වාර්තාව, වර්තමාන ප්‍රතිකාර හා අනාගත යෝජනාවලින් ද සමන්විත වේ.

**53.** මෙම ඡේදයෙන් විස්තර කෙරෙනුයේ,
(1) ආසාදනය නොවන රෝගවල විවිධ වර්ග පිළිබඳව ය.
(2) රෝගීන් සඳහා අතීත සහ වර්තමාන ප්‍රතිකාර පිළිබඳව ය.
(3) මවගෙන් දරුවාට දියවැඩියාව සංක්‍රමණය වන විවිධ ආකාර පිළිබඳව ය.
(4) දියවැඩියා මධ්‍යස්ථානවලදී ලබා දෙන රුධිර, මූත්‍රා හා X-කිරණ වාර්තා පිළිබඳව ය.
(5) දියවැඩියා මධ්‍යස්ථාන හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ය.

**54.** මෙම ඡේදයෙහි ප්‍රකාශිත ලෙස සඳහන් **නොවන්නේ** පහත දැක්වෙන කවරක් ද?
(1) දියවැඩියා රෝගවල විවිධ ආකාර
(2) දියවැඩියා රෝගීන් සඳහා විවිධ පරීක්ෂා
(3) රෝගියා ලක් කෙරෙන වර්තමාන ප්‍රතිකාර
(4) කිසියම් පරාමිති සඳහා පරීක්ෂා කෙරෙන රුධිර හා මූත්‍රා නියැදි
(5) මහ රෝහල්වල ස්ථාපිත දියවැඩියා මධ්‍යස්ථාන


- අංක **55** හා **56** ප්‍රශ්න යටතේ ප්‍රකාශ තුන බැගින් ඇති කුඩා ඡේද පහක් බැගින් දී ඇත. ඉන් එක් ඡේදයක දී ඇති ප්‍රකාශ තුන පමණක් තර්කානුකූල සම්බන්ධතාවක් පෙන්වීම සඳහා නැවත පිළියෙල කළ හැකි ය. තර්කානුකූල සම්බන්ධතාවක් පෙන්වීම සඳහා නැවත පිළියෙල කළ හැකි ප්‍රකාශ තුන අඩංගු ඡේදය තෝරන්න.

**55.** (1) මේස ඔරලෝසුවෙහි දෝෂයක් නිසා එහි සීනුව නාද නොවේ. මව, නිදා ගැනීමට පෙර, නියමිත වේලාවට නාද වන සේ මේස ඔරලෝසුවේ සීනුව සකස් කරයි. කිසිවෙක් පෙ.ව. 5.00 ට අවදි නොවෙති.
(2) මේස ඔරලෝසුවෙහි සීනුව පෙ.ව. 5.00 ට නාද වෙයි. දුව, නිදා ගැනීමට පෙර, නියමිත වේලාවට නාද වන සේ මේස ඔරලෝසුවේ සීනුව සකස් කරයි. මව රෝහලට යාම සඳහා, සීනුව නාද වන විට අවදි වෙයි.
(3) වී වගාව සඳහා යන්ත්‍ර භාවිත කෙරේ. වී අස්වනු නෙළන යන්ත්‍රය පැමිණ ඇත. ඉතා කෙටි කාලයක් තුළදී කාර්යය නිම කෙරේ.
(4) වී අස්වනු නෙළන යන්ත්‍රය වී අස්වනු නෙළීමෙහි යෙදෙයි. මේ දිනවල වී අස්වනු නෙළීම සඳහා යන්ත්‍ර භාවිත කෙරේ. යන්ත්‍ර භාවිත කිරීම ලාභදායී වේ.
(5) ගොවිපළ යන්ත්‍ර අස්වනු නෙළීමට පමණක් නොව වගා කටයුතු සඳහා ද භාවිත කෙරේ. යන්ත්‍ර වඩා ලාභදායී වේ. යන්ත්‍ර වඩා කඩිනම් ද වේ.


**56.** (1) රා ආසවනය මගින් අරක්කු නිපදවනු ලැබේ. රා සෘජුවම ද පරිභෝජනය කෙරේ. දුම්වැටි සහ සැර මත්පැන් භාවිතය අඩු කිරීමට රජය අදහස් කරයි.
(2) මද්‍යසාර සහ ඉතා සුළු වශයෙන් ප්‍රෝටීන, සීනි, විටමින හා ඛනිජ ලවණවලින් රා සමන්විත වේ. අරක්කු ප්‍රධාන වශයෙන් මද්‍යසාරවලින් සමන්විත වේ. තෙලිදිය (නොපැසුණු රා) ප්‍රධාන වශයෙන් සීනිවලින් සහ ප්‍රෝටීන, විටමින හා ඛනිජ ලවණවලින් සමන්විත වේ.
(3) පොල්, කිතුල් සහ තල්වලින්, තෙලිදිය සහ රා නිස්සාරණය කරගනු ලැබේ. ශ්‍රී ලංකාව පුරා පොල් වැවේ. ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර තල් වැවෙන අතර උඩරට කිතුල් වැවේ.
(4) අධික වර්ෂාව ගංවතුරට හා නායයෑම්වලට හේතු වේ. කරදරයට පත්වූ ජනතාවට රජය වන්දි ගෙවයි. ගංවතුර සහ නායයෑම් හේතුවෙන් නිවාසවලට හානි පැමිණෙන අතර සමහර විට එය මිනිසුනට තුවාල සිදු කිරීමට මෙන්ම මිනිසුන් මරණයට පත් කිරීමට ද හේතු වේ.
(5) අධික වර්ෂාව හේතුවෙන් වන නායයෑම් ප්‍රධාන වශයෙන් සිදුවන්නේ කඳුකරයේ ය. අධික වර්ෂාව හේතුවෙන් ඇති වන ඇඩි ගංවතුර නිසා නිවාසවලට හානි පැමිණේ. ඇඩි සුළඟ ද නිවාසවලට හානි පැමිණවීමට මෙන් ම මිනිසුන් මරණයට පත් කිරීමට හේතු වේ.

[අටවැනි පිටුව බලන්න.

**57.** කිසියම් සිදුවීමක් සම්බන්ධව රූපසටහන් හයක් පහත දී ඇත. එම රූප නිවැරදි අනුක්‍රමයට පිළියෙල කෙරෙන වරණය තෝරන්න.




*A* *B* *C*



*D* *E* *F*

(1) ABCDEF (2) ABDECF (3) ABECDF (4) BADECF (5) BAEDCF

- අංක **58, 59** හා **60** යන ප්‍රශ්න විදුලි මනු කියවන්නකු හා ගෘහ කාන්තාවක අතර ඇගේ නිවසේදී සිදුවූ සංවාදයක කොටස් මත පදනම් වේ. එහෙත් ඒවා පහත දී ඇත්තේ නිවැරදි අනුක්‍රමය අනුව නොවේ.

*A* - සුබ උදෑසනක්, මනු කියවන්නාණෙනි! කරුණාකර කරගෙන යන්න.

*B* - සුබ උදෑසනක්, මහත්මියනි! විදුලි මනුව කියවීම සඳහා මා ඇතුළට එන්න ද?

*C* - මෙවර ගාස්තුව වෙනදාට වඩා වැඩි ඇයි?

*D* - ගාස්තුව වැඩි වී ඇත්තේ සහනදායී ඒකක සංඛ්‍යාව ඉක්මවා විදුලිය පාවිච්චි කර ඇති නිසයි.

*E* - ඔහුට කුමක් සිදුවෙලා ද?

*F* - ඔහුගේ ශරීර උෂ්ණත්වය ඉහළ ගිහින්. නොකඩවාම උණ තිබෙනවා. ඩෙංගු යැයි සැක කෙරෙනවා.

*G* - විදුලි මීටරය අවට අපවිත්‍රයි. මකුළුදැල්වලින් වැහිලා.

*H* - මනු කියවීම, ගෙවිය යුතු මුදල හා හිඟ මුදල් ඇත්නම් එය ඇතුළත් විදුලි ප්‍රකාශය මෙන්න.

*I* - කණගාටුයි. මගේ සහෝදරයා අසනීප වී රෝහල්ගත කිරීමට සිදු වූ නිසා මට වැඩ අධික වුණා. මට එතැන පිරිසිදු කරන්නට නොහැකි වුනා.

*J* - අනවශ්‍ය ලෙස දැල්වෙන විදුලි පහන් හැකිතාක් දුරට නිවා දමන්න ඕනෑ. විදුලිය පිරිමසින LED බුබුළු පාවිච්චි කරන්න ඕනෑ. සිවිලිම් පංකා ඇතුළුව විදුලිය වැඩියෙන් වැය කෙරෙන විදුලි උපකරණ පාවිච්චිය අඩු කරන්න ඕනෑ.

*K* - විදුලි පරිභෝජනය අඩු කළ හැකි ක්‍රම මොනවා ද?

*L* - ඔබට ස්තුතියි!

**58.** මෙම සංවාදයෙහි විදුලි මනු කියවන්නා විසින් ප්‍රකාශිත කොටස් මොනවා ද?

(1) *ADEGHJ* (2) *ADEHIJ* (3) *BDEGHJ* (4) *BDFGHJ* (5) *BDFGJK*

**59.** මෙම සංවාදයෙහි ගෘහ කාන්තාව විසින් ප්‍රකාශිත කොටස් මොනවා ද?

(1) *ACFIKL* (2) *ACHIKL* (3) *AFGIKL* (4) *BCFIKL* (5) *BCHJKL*

**60.** සංවාදයෙහි වඩාත් තර්කානුකූල අනුක්‍රමය තෝරන්න.

(1) *ABGIEFHCKJDL* (2) *ABHCGIEFDKJL* (3) *BAGIEFHCDKJL*
(4) *BAGIHCEFDKJL* (5) *BAHCGIEFDKJL*

* * *